(61)

ලැබුණා 08 MAY 2024 ධීවර අමාත්‍යාංශය

ධීවර අමාත්‍යාංශය 08 MAY 2024 ලේකම් කාර්යාලය

# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
# புத்தசாசன, மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
# Ministry of Buddhasasana, Religious and Cultural Affairs

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | MBRCA/02/15/Foreign | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024.05.8 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

<u>තායිලන්තයේ තාවකාලික පැවිද්ද සඳහා රජයේ නිලධාරීන් යොමු කිරීම</u>

බෞද්ධ රාජ්‍යයක් ලෙස තායිලන්තය තාවකාලික පැවිද්ද ලබා දීම වෙනුවෙන් මුළු මහත් ලෝකයේම ප්‍රසිද්ධියක් උසුලයි. ඒ අනුව ලෝකයේ බොහෝ පිරිස් තාවකාලික පැවිද්ද ලබා ගැනීමට තායිලන්තය බලා යාම සිදුවේ. එමෙන්ම විවිධ විශේෂ අවස්ථා මූලික කර ගනිමින් තාවකාලික පැවිද්ද සඳහා ද විශේෂ වැඩසටහන් පැවැත්වීම තායිලන්ත රජය විසින් සිදුකරනු ලබයි.

02. ඒ අනුව තායිලන්ත රජුගේ ජන්මදිනය මූලික කරගනිමින් දෙරට අතර ඓතිහාසික ආගමික සහ සංස්කෘතික සබඳතා වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රජාව වෙනුවෙන්ම විශේෂ තාවකාලික පැවිදි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තායිලන්ත රජය මෙම වසරේ සැලසුම් කර ඇත.

03. මෙ යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා අවස්ථාව ලබා දීමට තායිලන්ත රජය එකඟතාවය ලබා දී ඇත. ඒ අනුව මෙම වැඩසටහන 2024 වර්ෂයේ ජුනි මාසයේදී දින 15ක් පුරාවට තායිලන්තයේදී පැවැත්වීමට තීරණය කර ඇති බවත් ඒ සඳහා ශ්‍රීලංකාවේ රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විධිමත්ව තෝරාගෙන එම වැඩසටහන හා සම්බන්ධ කිරීමට මැදිහත් වන ලෙසත් ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපතිතුමා විසින් මා දැනුවත් කර ඇත.

වැඩසටහන සඳහා අදාල කොන්දේසි පහත පරිදි වේ.

i. ශ්‍රී ලංකාවේ රජයේ නිලධාරීන් (පුරුෂ පාර්ශවය පමණකි) මෙ සඳහා සහභාගී කරවීම.
ii. මෙ සඳහා කැමැත්තක් දක්වන බෞද්ධාගම හා ආගමික කටයුතු වෙනුවෙන් විශේෂ ඇල්මක් දක්වන නිලධාරීන් තායිලන්ත තානාපති කාර්යාලය හා බුද්ධශාසන අමාත්‍යාංශය ඒකාබද්ධව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තෝරා ගැනීම.
iii. තෝරාගනු ලබන නිලධාරීන් සඳහා ආහාරපාන, ගුවන් ටිකට්පත් හා නවාතැන් තායිලන්ත රජය විසින් ලබා දීම.
iv. සම්මුඛ පරීක්ෂණයෙන් වැඩසටහන සඳහා තෝරාගනු ලබන නිලධාරීන් සඳහා වැඩසටහනට පූර්වයෙන් දින 4ක මූලික පුහුණුවක් තායිලන්ත ස්වාමීන්වහන්සේලාගේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකාවේ දී පැවැත්වීම.
v. ශ්‍රී ලංකා රජය විසින් පඩි සහිත විදේශ නිවාඩු ලබාදෙනු ලබන අතර වෙනත් කිසිදු දීමනාවක් මෙ වෙනුවෙන් ලබා නොදීම.
vi. තෝරා ගනු ලබන නිලධාරීන් වැඩසටහන සඳහා පිටත්වීමට ප්‍රථම නැවත සේවයට වාර්තා කිරීම සම්බන්ධව ගිවිසුමක් සඳහා එළඹීම.

04. මෙ සඳහා තෝරාගැනීමේ නිර්ණායක මෙ සමග අමුණා ඇති අතර (ඇමුණුම ii) අදාල අයදුම්පත්‍රය මෙහි සඳහන් දිගුව ඔස්සේ google පෝරමයක් ලෙස ඉදිරිපත් කර ඇත. ඒ අනුව අදාල අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් යොමු කිරීමට ඔබ අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් දැනුවත් කරන්නේනම් කෘතඥ වෙමි. කිසිදු හේතුවක් නිසා මාර්ගගත ක්‍රමයෙන් අයදුම් කිරීමට නොහැකි වන අයදුම්කරුවන් පිළිබඳ සලකා බැලීමක් සිදු නොවේ.

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07. இல. 135, ஸ்ரீமான் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
No. 135, Sreemath Anagarika Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2307694, 011 - 2307674
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2307688, 011 - 2300513
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: http://www.mbs.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: info@mbs.gov.lk
ලේකම් / செயலாளர் / Secretary: 011 - 2307430, Fax: 011 - 2307406
E-mail: mbsecoffice@gmail.com

05. මෙම වැඩසටහන සඳහා රාජ්‍ය සේවයේ සියළුම සේවාවන් නියෝජනය වන පරිදි අයදුම්කරුවන් තෝරා ගැනීමට අමාත්‍යාංශය අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව ඔබ අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන, දෙපාර්තමේන්තු දැනුවත් කර මේ සඳහා කැමැත්තක් දක්වන නිලධාරීන් සඳහා අයදුම්පත් 2024.05.22 දිනට පෙර පහත ගූගල් සබැඳිය (Google Form) මගින් හෝ QR කේතය (QR Code) මගින් යොමු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන් ඉල්ලමි.

06. මාර්ගගත ක්‍රමයෙන් බැහැරව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මාර්ගගත ක්‍රමය ඔස්සේ පහත සඳහන් ලියවිලි දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ලබාගෙන ඉදිරිපත් කල යුතුය

a. අයදුම්කරු සඳහා ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහ දින 15ක විදේශ නිවාඩු සඳහා නිර්දේශය - ඇමුණුම - i
b. අයදුම්කරු විසින් නිරත ආගමික සහ ප්‍රජා සේවාවන් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතික කිරීම සහිතව (මාර්ගගතව අයදුම්පත පිරවීමේදී ප්‍රධාන/වැදගත්/අත්‍යවශ්‍ය එක් සහතිකයක් පමණක් උඩුගත (upload) කළ යුතුය. අමතර සහතික සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කලයුතුවේ.)

08.තායිලන්ත තානාපති කාර්යාලය මගින් කරනු ලබන තෝරා ගැනීම අවසන් වූ පසු කිසිදු අභියාචනයක් භාරගනු නොලැබේ.

09. තෝරාගනු ලැබූ නිලධාරීන් දැනුම්දීමකින් පසු එම නිලධාරීන් සඳහා රාජකාරි නිවාඩු පමණක් අනුමත කල යුතු අතර වෙනත් කිසිදු මුදලක් හෝ වරප්‍රසාදයක් හිමි නොවේ.

10. මෙම වැඩසටහන සඳහා නිළධාරීන් තෝරා ගැනීමේ නිර්ණායක මෙම අමාත්‍යාංශයේ වෙබ්අඩවියෙන් (https://www.mbs.gov.lk/) බාගත කරගත හැකිය.

Google Form Link
https://docs.google.com/forms/d/e/1FAIpQLSffwu0bXXqmH8nxsZ4PjUR_L45JiOPlduVodg2b01vL22wuRQ/viewform?usp=sf_link

**Shorten Link**
https://forms.gle/hdBdLPJQUpWzeeLL9

**QR Code**

මේ සඳහා ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පිටපත් -
01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කාරුණික දැනගැනීම සඳහා
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා

(Letter head)

Attachment - i

To Whom It May Concern,

**Recommendation for [Name of the Officer] for Application to be Ordained as a Buddhist monk (Temporary) in Thailand**

I'm writing to recommend **[Name of the Officer]** for becoming a temporary Buddhist monk in Thailand. As their supervisor at **[Institute/Ministry/Department/Division],** I've seen firsthand their hard work and dedication to both their job and community service.

[Name of the Officer] has always upheld our institution's values and made valuable contributions to our work. Their commitment to helping others, both in our organization and beyond, is truly admirable.

Furthermore, I agree to grant Mr. **[Name of the Officer]** 15 days off with pay for this program in Thailand.

Sincerely,

[Name of the Head of the Institution]

[Institute/Ministry/Department/Division Name]

[Contact Information]

Attachment ii

## Qualification for the participation in the Ordination in Thailand (June 2024)

1. Male serving in public/ government service of Sri Lanka, at the age between 35-50 years.
2. Buddhists with good faith, interest, and understanding of Buddhism and Buddhist teaching.
3. Good in physical and mental health and habits.
4. Commitment to public service (a letter certified by the supervising officer should be attached with the application)
5. willingness to follow discipline by living the life of a monk in Thailand, including practicing meditation, chanting in the morning and evening, learning Buddhist teachings, following food dietary restriction, and doing work-related physical activity, etc.
6. Behavior and Character: polite, open-minded with adaptability and leadership to serve as cultural ambassador -
7. Language skill: good at English
8. Participants must actively participate in the four-day preparation training for the ordination procedure in Colombo. The actual ordination ceremony will be in Thailand
9. Participants must actively participate full-time in the 15-day program activities in Thailand.
10. No allowances will be given from the government (air tickets, meals and accommodations in Thailand will be provided by the Thai Government).
11. Participants are not allowed to bring any family members or friends along with this program or separately during the period.
12. Commitments to the Community Service: Giving back is a core Buddhist principle. Officials with a history of community service could be strong candidates. (proof documents will be screened at the interviews)
13. The candidates will sign an agreement to participate in this program.
14. Follow-up: Participants may be asked to share their experiences and learnings with the community after their return.